## අවුරුදු ඇවිත්

ඉස්සර අවුරුද්දට මම කැමතිවුණේ අපි ජීවත්වුණ අපේ මහ ගෙදරට අපේ දෙමව්පියන්ගේ සියලුම නෑදෑයන් දවස් දෙක තුනකට හරි ඇවිත් අවුරුද්ද ගත කරලා යන පුරුද්දක් තිබුණ නිසා. අපේම කට්ටිය එක්ක එකට ගත කරන්න ලැබුණ ඒ කාලය මාරම සොමි කාලයක්. ඊට පස්සෙ ඒ සම්බන්ධතා විසිරිලා ගිහින් අපි හැමෝම අපේම පවුල් වශයෙන් වෙනමම අවුරුදු සැමරීමත් හොඳයි තමයි. ඒත් අර ඉස්සර



තිබුණ ගතිය තිබුණෙ නැහැ.

ඊටත් කාලෙකට පස්සෙ මෙහෙට සංක්‍රමණය වෙලා දස අතේ විසිරිලා හිටපු අපේ දන්න කියන ග්‍රහයො ටික ඒකරාශී වෙන්න ගත්තෙ ඩැන්ඩිනොන් වල ටෙක් එකේ අවුරුදු සැමරුම නිසයි. අවුරුද්දකට සැරයක් එකතු වෙන ඒ දවසත් මට හැමතිස්සෙම සිහිකරන්නෙ අපේ පරණ මහ ගෙදර ගහක් යටට වෙලා ස්පීකර් සද්දෙ මැද්දෙ පරණ යාලුවො සෙට් එකත් එක්ක කන බොන නටන හැටි. ඒකත් අවුරුදු සැමරීමක් තමයි. හා නැද්ද? සංස්කෘතිය කියන්නෙත් ඉතින් මිනිස්සු කන බොන නටන අඳින පළඳින විදිහනෙ. ඉතින් අන්න ඒක නිසා සේරම අමතක කරලා අපි පොඩි ආතල් එකක් ගන්නෙ නමවෙනිදට සේරටම සුබ අලුත් අවුරුද්දක් කියලා පතන ගමන්.

## අප්‍රේල් 5

මතක ඇති කාලෙක ඉඳලා ලංකාවෙයි මෙහෙයි හැම අවුරුද්දකම අප්‍රේල් මාසෙ විරුවෝ සමරණ වැඩේ කරනවා. ඉන්නෙ ටික දෙනයි තමයි. ඒ හිටපු සෙට් එකත් බෙදිලා බවත් ඇත්තයි. ඒත් තුන හතරට කැඩිලා වුණත් එකට බැරිනම් වෙන් වෙන්ව හරි මේ යුතුකම කරන එක වටිනවා.

බොහෝ දෙනෙක් අප්‍රේල් විරුවො ගැන දන්නෙ නැහැ. දන්නෙ 88 - 89 කට්ටිය ගැන විතරයි. හැම අප්‍රේල් මාසෙම අලවන "සදා සමරමු සොහොයුරෝ" පෝස්ටර් මිටියක් අරගෙන අලවන්න යන එවුන් ගැන



මරුණ උන්ට වඩා දුකක් මට දැනෙන්නෙ මොකද මන්දා..

සටනක් කර මැරෙන එක පහසුයි මේ වගේ ව්‍යාපාරයක් ඇදගෙන යනවට වඩා. මගේ දුක වැඩි වෙන්නෙ තව කොපමණ කාලයක් ඇදගෙන යන්න වේවිද කියලා හිතනකොට. ඍණාත්මකව හිතලා නෙමෙයි. දැනෙන පෙනෙන නිසයි ලිව්වෙ.

## උදේ හවා බණ අහන අපි

මිනිස්සු තමන්ගෙ අවේග පිට කරන අන්දම නොයෙක් විදිහට චූටි මල්ලිගෙ ජීවිත කාලෙ පුරාම දැකලා තියෙනවා. ඒත් මිනිස්සු අසාමාන්‍ය විදිහට ක්‍රියා කරනවා නම් දැක්කෙ ඉතාමත් කලාතුරකින්. මරනවා කියන්නෙ එකක්. ඉතිරි ජීවිත කාලෙම විඳවමින් ඉන්න වෙන විදිහට පලිගන්නවා කියන්නෙ වෙන එකක්.

ක්ෂණික කෝපයකට මිනිස්සු එකක් නෙවෙයි මිනී දෙක තුනක් බාවනවා උහුලගන්න පුලුවන්. ඒත් මරන්නෙ නැතුව පිහියකින් නෙවෙයි පොරවකින් ගහලා මූණ විරූපි කරලා දාන්න හිතෙනවා කියනකොටම ඇඟ සලිත වෙලා ගිහින් මැවෙන්නෙ උන්මන්තයකුගෙ රූපයක්.

මේ කියන්න හදන්න යන කතන්දරේ දැන් හුඟ දෙනෙක් දන්නවා. ඒකෙ ඇතුළාන්තය අපි හරියටම දන්නෙ නැහැ. එහෙන් මෙහෙන් ඇහෙන ඒවා පුරුද්දලා තමයි අපි සිද්දිය මවා ගන්නෙ. කොහොම වුණත් දැන් එකෙක් හිරේ. අනෙකා සදාකාලලිකව විරූපීව රෝහලේ. දරුවෝ අනාතයි. උන් ගෙවන්නෙ කාගේ පව්ද? තවමත් අපේ මිනිස්සුන්ගෙ හදවත් තෙත් වෙන නිසා තාවකාලිකව සහනයක් ලැබේවි ඔවුන්ට. ඒත් අනාගතය..? පිස්සු හැදෙනවා ලොක්කා අපේ රටේ එකෙක්



මෙහෙම ගේමකට සෙට් වුණා කිව්වම. ඕකට නොයෙක් දෙනා අනේක කතන්දර කියනවා ඇති. ඒත් චූටි මල්ලි නම් ඒකට කියන්නේ ලිංගික ඊර්ෂ්‍යාව කියලයි. ලිංගික ඊර්ෂ්‍යාව අපේ රටේ හොහෝ පිරිමින්ට තියෙන භයානක රෝගයක්. ඒකෙ ප්‍රතිඵලය බොහොම දරුණුයි. දෙකෙන් එකක් නැති වෙනවාම තමයි. ලංකාවෙ නම් ඉස්සර ඕවට ඇසිඩ් ගහන සීනුත් තිබුණා. දැන් මිනිස්සු ඊට වඩා දියුණුයි.

එක්වීම් වෙන්වීම් ආපසු එක්වීම් බැඳීම් කැඩීම් ලොකෙ පුරාම වගේ ලංකාවෙත් සාමාන්‍ය ක්‍රමය වෙලා තියෙද්දි මෙහෙම වෙන එකනෙ පුදුමෙ. ඇරත් මේ නූගත් මිනිස්සුද? මට නම් මාර ෂොක් එකක්. ඒක වැඩි වෙන්නෙ දන්න කියන වට පිටේ එවුන් ඇන ඇන විස්සර අහනකොට.

බණ අහන පින්ම කරන ජාතියක කොටස් කාරයෝ වෙච්ච අපේ එවුන් මේ කොයි යන්නේ කියලා තමයි අහන්න වෙන්නෙ. මොනවා කරන්නද. කොයි කවුරුත් අර කිව්වා වගේ පතාගෙන ආපු විදිහට ඔතාගෙන යාවිනෙ.. අවසානයට හරි රූපය දිරන බව කට්ටියට තේරුම් ගන්න පුලුවන් නම්.

## පියසේන මහත්තයත් ගිහින්

ඇස් පියසේන මහත්තයා මිය ගිහින්. දවුල්දෙන ඥානිස්සර හාමුදුරුවොත් අපවත් වුණේ ඊයෙ පෙරේදා. දෙන්නම භාෂා පිලිබඳ ප්‍රවීණයන්. වැඩේ කියන්නෙ මේ ලෝකේ හොඳ නමක් තියපු මිනිස්සු වියෝ වෙන්නෙ ඩබල් දාලා වගේනෙ.
නිකමට
ඉතිහාසය හොයලා
බලන්න. නමක් තියපු කෙනෙන් යන්නෙ ඒ හා සමාන කෙනෙකුටත් අඬගහගෙන වගේ පෙනේවි.

කොහොමත් පියසේන මහත්තයගේ පාඨකයෙන් විදිහටත් දෙතුන් වතාවක් දුරකතනයෙන් කතා කරලා තිබුණ නිසත්



ඔහු අපට සමීපයි. ඒ නිසා ඔහු ගැන විවෘතවම කතා කරන්නත් අපට පුලුවන්. වාමාංශික පසුබිමකින් හුඟක් දේවල් ආරම්භ කළ ලංකාවෙ බොහෝ ප්‍රසිද්ධ මිනිස්සු අවසන් කරන්නෙ දක්ෂිණාංශයෙන්. පියසේන මහත්තයට නිසි ගෞරවයක් අප තුළ තිබුණත් අවසන් කාලයෙදි ඔහුගේ ආස්ථානය පිළිබඳව නම් මගේ එතරම් පැහැදීමක් තිබුණෙ නැහැ. ඒ අපේ රටේ උගතුන් බොහෝ විට ගමනාන්තය කරන හැටි කියලා හිත හදාගෙ බලන් හහිටියා. ඒ කොහොම වුණත් ඔහු වැනි උගතුන් ගේ හිස් තැන නම් පුරවන්න හම්බු වෙන්නෙ නෑ මේ කපේදි.

## ඇති යන්තම්

අද හොඳ නිව්ස් එකක් අහන්න ලැබුණා. මෙල්බන් එයාපෝට් එකට දුම්රිය මාර්ග පහසුකම් ඇති කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට රජය තීරණය කරලා. මෙච්චර කල් ඒක පමා වෙන්නෙ ඇයි කියලා අපි කොච්චර නම් කතා කරලා ඇද්ද.

ලෝකයේ බොහෝ ගුවන් තොටුපල වලට දුම්රිය මාර්ග පහසුකම් තියෙනවා. සිඩ්නි වල පවා. ඉතින් දැන් ඒක හරි. හැමදාම ලංකාවට යනකොට කාට හරි කරදර කරන්නම වුණා. එන මිනිහ පෙට්‍රල් ගහගෙන ටොල් එකට ගෙවාගෙන ඒ මදිවට ටිකක් හරි වෙලා හිටියොත් පාකින් වලට මාර ගාණක් ගෙවාගෙන අම්බ කට්ටක්නෙ කන්නෙ. දැන් ඒක බාගයකින් වත් අඩුම තරමින් අඩුවේවි. ලංකාවට යනකොට නම් කවුරුහරි එක්ක ගියත් ආපහු එනකොටවත් කාටවත් කාරදර කරන්නෙ නැතිව එන්න පුලුවන් වේවි. මේක නම් හැකි ඉක්මණින් අවසන් කළ යුතු ව්‍යාපෘතියක්.

ස්තුතියි අගමැතිතුමනි. මෙන්න ඔබට ඩබල් සැලියුට්.

## තීරණයක් ගන්න වෙලාව ඇවිත්

සයිටම් සටන ගැන චූටි මල්ලි නොයෙක් වර ලියලා තියෙවා. සයිටම් ගැන චූටි මල්ලිට විශේස ආසාවක් නැහැ. ඒත් චූටි මල්ලිට මේ කාරණයෙදි තියෙන්නෙ වෙනින්ම වේදනාවක්.

ලංකාවේ විශ්ව විද්‍යාල වලට යන්නට අවස්ථාව ලැබෙන්නෙ කීයෙන් කී දෙනාටද. ඒතැනින් බිමට වැටෙන ශිෂ්‍යයන්ට ඉස් සරහට යන්න තියෙන පාරවල් වහන්න දත කන එකටයි චූටි මල්ලිගෙ විරෝධය තියෙන්නෙ. හරියට ගණන් කරලා බැලුවොත් ලංකාවෙ උසස් අධ්‍යාපනය ලබපු අයගෙන් බහුතරය ආණ්ඩුවෙ විශ්ව විද්‍යාල වලට ගිය අය නෙනෙයි. චාටඩ් එකවුන්ටින් සීඅයිඑම්ඒ (සීමා) ඒඒටී ඒසීඑස් සිඊඅයි වැනි පිටරට සහ එන්අයිබීඑම් ඒඒටී (SL) අයිඊඑස්එල් වැනි දේශීය සුදුසුකම් වලින් ඉදිරියට ගිය අය ලක්ෂ ගණනක් ලංකාවෙ ඉන්නවා. මේ අය ධනපතියන් නෙවෙයි. ධපතියන් කරන්නෙ ඉතා පහසුවෙන් තමන්ගෙ දරුවන් පිටරටකට යවා උපාධි අරගෙන දෙන එකයි. **පුද්ගලික අධ්‍යාපන මාර්ග වසා දමන්නට වලිකන මේ**




**වාමාංශික පක්ෂ කරන්නෙ දැනුවත්ව හෝ නොදැනුවත්ව තමන්ගෙම මිනිස්සුගෙ වල කපන එක.**

දොස්තරල මේ සටනට බැහැල තියෙන එක ගැන පුදුමයක් නැහැ. උන් හෙදියන්ට අවුරුදු හතරක උපාධියක් දෙනවටත් විරුද්ධ වෙච්ච කුහක කල්ලියක්නෙ. හැමදේම තමන්ට විතරයි කියන මානසිකත්වයෙ ඉන්න පිරිසක්නෙ. ජවිපෙ ගිහින් දොස්තරලට හේත්තු වුණාට දොස්තරල කවදාවත් ජවිපෙට හේත්තු වෙන්නෙ නැහැ.

මේ ව්‍යාපාරය පසුපස්සෙ තියෙන්නෙ වෙන මොන කෙහල්මලක්වත් නෙවේ. පවතින රජය අපහසුතාවට පත් කිරීමේ අරමුණ. පවතින රජය අපහසුතාවට පත් කිරීමේ ඒකායන අරමුණෙන් ශිෂ්‍යයන්ට ඉදිරියට යන්න තියෙන පාරවල් වහන්න දඟලන මේ මිනිස්සු ගැන චූටි මල්ලිගෙ හිතේ තියෙන්නෙ පුදුම අප්‍රසාදයක්. තවත් දුකක් ඇති වෙන්නෙ අපි ආදරය කරන ජවිපෙත් මේ අදූරදර්ශී මාර්ගයට බලෙන්ම පැන්න එකටයි.

යාවත්කාලීන නොවන දේශපාලන පක්ෂ පසුපස්සෙ තවදුරටත් යනවද නැද්ද කියන තීරණය අපට දැන් ගන්න වෙලා තියෙනවා.

**චූටි මල්ලි**